# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

## 1990 අංක 06 දරණ
## පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල)
## ප්‍රඥප්තිය

(අනුමත කළ දිනය: 1989-09-10)

වයඹ පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1992 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV අ කොටසේ පළ කරන ලදී.**

සතොස මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

---

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිළදී ගත හැක.

**මිළ : රු. 5/-** **තැපැල් ගාස්තුව 1/-**

# වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරණ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

වයඹ පළාතේ පළාත් සභාවේ ලේකම් කාර්ය මණ්ඩලයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහාත්, එයට පත් කරනු ලබන තැනැත්තන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ සේවා කොන්දේසි විධිමත් කිරීම සඳහාත් ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධි විධාන සැලැස්වීම සඳහාත් වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරණ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය*

2. (1) පළාත් සභාවෙහි ලේකම්වරයෙක් වන්නේය. ඔහු ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලැබෙන අතර ලේකම්වරයා යථා පැවැත් මෙන් සිටිනතාක් සවකීය ධුරය දරන්නේය. *සභාවේ ලේකම්වරයා*

(2) පළාත් සභාවේ ඉල්ලීම මත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු එකී නිලධාරියාගේ හා අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ නැතහොත් ආණ්ඩුකාර වරයාගේ හෝ ඔවුන් වෙනුවෙන් කටයුතු කිරීමට බලය පැවරී ඇති වෙනත් අයවළුන්ගේ හෝ එකඟත්වය ඇතිව ලේකම් ධුරයට ඉහත (1) අනුඡේද යටතේ පත්කළ හැකිය.

(3) ලේකම්වරයාගේ වැටුප පළාත් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේය. එසේ නිශ්චය කරන ලද වැටුප ඔහුට පෞද්ගලික වන අතර පළාත් අරමුදලට වැය බරක්

වන්නේය. ඔහුගේ ධූර කාලය තුළ ඔහුගේ වැටුපෙහි හෝ ඔහුට දී ඇති පහසුකම්වල හෝ අඩු කිරීමක් සිදු නොවිය යුත්තේය.

(4) ලේකම් ධූරය විශ්‍රාම වැටුප් හිමි තනතුරක් වන්නේය.

(5) ලේකම්වරයා --

(අ) මියයාමෙන් හෝ

(ආ) ආණ්ඩුකාරවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් හෝ

(ඇ) වයස අවුරුදු පනස්පහ සම්පූර්ණ වීමේ දී හෝ ඊට පසු ඕනෑම අවස්ථාවකදී ආණ්ඩුකාරවරයාට තෙමසක දැනුම්දීමකට යටත්ව විශ්‍රාම ගැනීමේ මනාපය පාවිච්චි කිරීමෙන් හෝ;

(ඈ) සභාව විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින් අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස වයස අවුරුදු හැට සම්පූර්ණ වීමෙන් හෝ,

(ඉ) රෝගාතුරවීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාවයක් නිසා හෝ ආණ්ඩුකාරවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ,

(ඊ) පළාත් සභාව විසින් සම්මත කොට ඉදිරිපත් කරන යෝජනාවක් අනුව ආණ්ඩුකාරවරයා විසින් ඉවත් කරනු ලැබීමෙන් හෝ

ලේකම් ධූරය හිස් වන්නේය.

(6) ලේකම්වරයාට සිය ධූරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි අවස්ථාවකදී ඔහු වෙනුවෙන් වැඩ බැලීමට තැනැත්තෙකු ආණ්ඩුකාරවරයා විසින් පත්කළ හැකිය.

**ලේකම් කාර්ය මණ්ඩලය**

3. (1) වයඹ පළාතේ පළාත් සභාවේ ලේකම් කාර්ය මණ්ඩලය වෙනමම සේවාවක් වශයෙන් සංයුක්ත වන අතර, එය මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලින් පාලනය වන්නේය.

(2) ලේකම් කාර්ය මණ්ඩලයේ සාමජිකයන් සභාවේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය යුතුවේ.

(3) ලේකම් කාර්ය මණ්ඩලයේ තනතුරු විශ්‍රාම වැටුප් හිමි තනතුරු වන්නේය.

**රාජ්‍ය නිලධාරීන් හා පළාත් රාජ්‍ය සේවයේ ලේකම් කාර්ය මණ්ඩලයට පත්කිරීම**

4. පළාත් සභාවේ ඉල්ලීම මත රාජ්‍ය සේවයේ හෝ පළාත් රජ්‍ය සේවයේ ඕනෑම නිලධාරියෙකු එකී නිලධාරියාගේ හා අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ නැතහොත් අණ්ඩුකාරවරයාගේ හෝ ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට බලය පැවරී ඇති වෙනත් අයෙකුගේ එකඟත්වය ඇතිව ලේකම් කාර්ය මණ්ඩලයේ තනතුරකට තාවකාලිකව හෝ ස්ථිරව හෝ පත්කළ හැකිය. මෙම නිලධාරීන් සම්බන්ධයෙන් අන්‍යොන්‍ය වශයෙන් ගිවිස ගනු ලබන සේවා කොන්දේසි බලපැවැත්විය යුතුය.

**ලේකම්වරයා හා කාර්ය මණ්ඩලය ධූරදැරීම අවසානවීම**

5. රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයක් අනුව ලේකම් ධූරය නැතහොත් ලේකම් කාර්ය මණ්ඩල සේවය අහෝසි කිරීමේ හේතුවෙන් ලේකම්වරයා විසින් නැතහොත් ලේකම් කාර්ය මණ්ඩල සේවයේ සාමාජිකයකු විසින් ධූර දැරීම අවසන් වුවහොත් ඔහු යථා යෝග්‍ය පරිදි 2 (2) නැතහොත් 4 ඡේද යටතේ පත් කරනු ලැබුවෙක් නම් ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි කලින් දැරූ තනතුරට හෝ වෙනත් තනතුරකට හෝ පත් කරනු ලැබීමට හෝ තනතුර අහෝසි වීමේ පදනම මත විශ්‍රාම ගන්වනු ලැබීමට හෝ ඔහුට හිමිකම තිබිය යුත්තේය. ඔහු එසේ පත් කරනු ලැබූ නිලධාරියෙකු නොවේ නම් වෙනත් තනතුරකට පත් කරනු ලැබීමට හෝ තනතුරු අහෝසිවීමේ පදනම මත විශ්‍රාම ගන්වනු ලැබීමට හෝ හිමිකම ඇත්තේය.

**කාර්‍ය මණ්ඩල උපදේශක කමිටුව**

6. සභාපතිවරයා, සභානායක වරයා, විපක්ෂ නායක වරයා, ප්‍රධාන අමාත්‍යවරයා විසින් නම කරනු ලබන අයෙකු සහ සභාපතිවරයා විසින් පත් කරනු ලබන පළාත් සභා මන්ත්‍රීවරයෙකු යන අයගෙන් සමන්විත වන කාර්‍ය මණ්ඩල උපදේශක කමිටුවක් තිබිය යුතුය. සභාවේ සභාපතිවරයා හා ලේකම්වරයා පිළිවෙලින් කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ සභාපතිවරයා හා ලේකම් වරයා විය යුතුය.

**පළාත් සභා ලේකම් කාර්‍යමණ්ඩලයේ සංඛ්‍යාව, සුදුසුකම් හා වැටුප්**

7. (1) සභාවේ ලේකම් කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාවට ඇතුලත් තනතුරු හා සේවක සංඛ්‍යාව, එම තනතුරු වලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා එවැනි තනතුරු වලට අදාළ වැටුප් පරිමාණ, සභාවේ කාර්ය මණ්ඩල උපදේශක කමිටුව නිශ්චය කරන අයුරු විය යුත්තේ ය.

(2) ලේකම් කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා පළාත් අරමුදලට වැය බරක් විය යුත්තේ ය.

**ආයතන රෙගුලාසි**

8. වෙනත් කරුණු වලට අමතරව මතු දැක්වෙන කරුණුද අඩංගු වනසේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ ආයතන රෙගුලාසි සම්පාදනය කිරීමට කාර්ය මණ්ඩල උපදේශක කමිටුවට හැකිය.

(අ) වැටුප්, වැටුප් වර්ධක හා වෙනත් දීමනා ගෙවීම, නිවාඩු ලබාදීම, අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස නියම කිරීම හා විශ්‍රාම වැටුප් ගෙවීම ඇතුළුව එම සාමාජිකයන්ගේ සේවා කොන්දේසි.

(ආ) එවැනි සාමාජිකයන් වෙනුවට වැඩ බලන හෝ ඔවුන්ගේ රාජකාරි ඉටුකරන වෙනත් අයට වැටුප් හා වෙනත් පාරිශ්‍රමික ගෙවීම

9. මෙවනත් කරුණු වලට අමතරව සභාවේ පරිපාලනයට, කාර්ය මණ්ඩලයේ රාජකාරි හා හැසිරීමට හා ඔවුන්ගේ විනය පාලනයට අදළ සියළු කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ එකඟත්වය ඇතිව පාලන රෙගුලාසි සම්පාදනය කිරීමට සභාවේ ලේකම් වරයාට හැකිය. *පාලන රෙගුලාසි*

10. වැඩ තහනම් කිරීම, දඩුවම් කිරීම හා සේවයෙන් නෙරපීම ඇතුළුව ලේකම් කාර්ය මණ්ඩලයේ සාමජිකයන්ට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමේ බලය සභාපතිවරයා සමඟ සාකච්ඡා කිරීමට යටත්ව ලේකම්වරයා වෙත පැවරේ. මෙම බලය ක්‍රියාත්මක කළ යුත්තේ 9 වැනි ඡේදය යටතේ සම්පාදිත රෙගුලාසි වලට අනුව ය. *විනය පාලනය*

11. (1) වයස අවුරුදු පනස්පහ සම්පූර්ණ වීමේදී හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක විශ්‍රාම ගැනීමේ මනාපය ලේකම් කාර්යමණ්ඩලයට ලැබේ. විශ්‍රාම ගැනීමට අපේක්ෂිත දිනට මාස තුනකට නො අඩු කාලයකට පෙර ලේකම්වරයා වෙත දෙනු ලබන දැන්වීමක මාර්ගයෙන් මෙම මනාපය පළකළ යුතුය. *ලේකම් කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැනීම*

(2) වයස අවුරුදු පනස් පහ ඉක්මවා සේවය කිරීමට කැමති කවර හෝ සාමාජිකයකු වයස අවුරුදු පනස් පහ එළඹීමට නැත හොත් එයින් පසුව දෙනු ලැබූ දීර්ඝ කිරීමක් අවසන් වීමට නියමිත දිනයට මාස තුනකට නොඅඩු කාලයකට පෙර ලේකම්වරයා වෙත ඉල්ලීමක් කළ යුතුය. එවැනි දීර්ඝ කිරීමක් කළ හැක්කේ සභාපති වරයාගේ එකඟත්වය මතය. එවැනි දීර්ඝ කිරීමක් සඳහා ඉල්ලුම් කිරීමට අපොහොසත් වන සාමාජිකයෙකු යථායෝග්‍ය පරිදි වයස අවුරුදු පනස්පහ එළඹි දිනයේ දී විශ්‍රාම ගියාසේ සැලකේ.

12. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ලේකම් කාර්ය මණ්ඩලයට අදළ වැය ඇස්තමේන්තු, පළාත් අරමුදල *වැය ඇස්තමේන්තු*

සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා විසින් සම්පාදිත රීති වලට අනුකූලව ලේකම්වරයා විසින් සකස් කර ඉදිරිපත් කළ යුතුය.

**අතුරු විධිවිධාන**

13. වයඹ පළාත් සභාවේ ලේකම් ධුරයෙහි හෝ ලේකම් කාර්ය මණ්ඩලෙ; සේවාවේ තනතුරක හෝ රාජකාරි ඉටු කිරීම පිණිස 1988 මැයි මස පළමුවැනි දින හෝ ඊට පසුව හෝ පත් කරනු ලැබ මෙම ප්‍රඥප්තිය ආරම්භ වන දිනය වනවිට ලේකම්වරයාද ඇතුළුව තනතුරු දරණ ලේකම් කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු වේ නම් ඔහු තනතුු භාරගත් දිනයේ සිට මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලේකම් කාර්ය මණ්ඩලයට පත්කළ අයෙකු සේ සැලකිය හැකිය.

**අර්ථ නිරූපනය**

14. මෙම ප්‍රඥප්තියෙහි අන්‍යාකාරයෙන් සඳහන් නොවන කවර හෝ අවස්ථාවක,

''ආණ්ඩුකාරවරයා'' යනපදයෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා ද,

''ප්‍රධාන අමාත්‍යවරයා'' යන පදයෙන් වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ද,

''රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්'' යන පදයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ ලේකම්ද,

''ලේකම් වරයා'' යන පදයෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ලේකම් වරයා ද,

''විපක්ෂනායක වරයා'' යන පදයෙන් වයඹ පළාතේ පළාත් සභාවේ විපක්ෂනායකවරයාද,

''සභා නායකවරයා'' යන පදයෙන් වයඹ පළාතේ පළාත් සභාවේ සභා නායකවරයා ද,

''සභාපතිවරයා'' යන පදයෙන් වයඹ පළාතේ පළාත් සභාවේ සභාපතිවරයා ද,

''සභාව'' යන පදයෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

අදහස් කෙරේ.